# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.05.27 පැය 2310 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1085 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

**01. මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - අම්පාර කොට්ඨාස දූෂණ මධර්න ඒකකය.**

2025.05.27 වන අද දින සවස් කාලයේ ඉගිණියාගල පොලිස් වසමේ හිමුදුරාව වැවේ පිටවානය අසලදී අම්පාර කොට්ඨාස දූෂණ මධර්න ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු සහ ඊට අධාර අනුබල දුන් සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඉගිණියාගල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරුවන් අවුරුදු 19 සහ 20 වයස්වල පසුවන අම්පාර ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ඉගිණියාගල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - හසලක පොලිස් ස්ථානය.**

2025.05.27 වන අද දින සවස් කාලයේ හසලක පොලිස් වසමේ වරාගොල්ල ප්‍රදේශයේදී හසලක පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 53 ක් වන හසලක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හසලක පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නොච්චියාගම පොලිස් ස්ථානය.**

2025.05.27 වන අද දින උදෑසන කාලයේ නොච්චියාගම පොලිස් වසමේ බෝගස්වැව ප්‍රදේශයේදී නොච්චියාගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 37 ක් වන රනෝරාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නොච්චියාගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - අක්කරපත්තුව පොලිස් වසම.

2025.05.27 වන අද දින සවස් කාලයේ අක්කරපත්තුව පොලිස් වසමේ අක්කරපත්තුව කල්මුණේ මාගර්යේ අඩ්ඩාලච්චේන ප්‍රදේශයේදී අක්කරපත්තුව දෙස සිට කල්මුණේ දෙසට ධාවනය වූ ටිපර් රථයක් එම දෙසටම ඉදිරියෙන් ධාවනය වූ යතුරුපැදියක පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු අක්කරපත්තුව රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 40 ක් වූ පාලමුන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අක්කරපත්තුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ ටිපර් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. අක්කරපත්තුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - මිනුවන්ගොඩ පොලිස් වසම.

2025.05.27 වන අද දින සවස් කාලයේ මිනුවන්ගොඩ පොලිස් වසමේ මිනුවන්ගොඩ වේයන්ගොඩ මාගර්යේ දෙවලපල ප්‍රදේශයේදී මිනුවන්ගොඩ දෙස සිට වේයන්ගොඩ දෙසට ධාවනය වූ යතුරුපැදියක් ඉදිරියෙන් ගමන් කළ වාහනයකට ඉස්සර කිරීමට යාමේදී ප්‍රතිවිරුද්ධ දිසාවෙන් පැමිණි ලොරි රථයක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු මිනුවන්ගොඩ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 26 ක් වූ හිඹුටියාන, නිට්ටඹුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මිනුවන්ගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ ලොරි රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මිනුවන්ගොඩ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - පනාමුර පොලිස් වසම.

2025.05.27 වන අද දින සවස් කාලයේ පනාමුර පොලිස් වසමේ පනාමුර ගමකන්ද මාගර්යේ බටතිඹුර ප්‍රදේශයේදී ගමකන්ද දෙස සිට පනාමුර දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාගර්යෙන් ඉවතට පැන විදුලි රැහැන් කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු ඇඹිලිපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 34 ක් වූ බටතිඹුර, ඕමල්පේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ඇඹිලිපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පනාමුර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - උහන පොලිස් වසම.

2025.05.26 වන දින රාත්‍රී කාලයේ උහන පොලිස් වසමේ කහටගස්යාය මහකණ්ඩිය මාගර්යේ කහටගස්යාය ප්‍රදේශයේදී කහටගස්යාය දෙස සිට මහකණ්ඩිය දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාගර්යෙන් ඉවතට පැන වාරි ඇලකට වැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු අම්පාර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 23 ක් වූ මහකණ්ඩිය, උහන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ඥාතීන්ට භාර දී ඇති අතර උහන පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**